

වාර්ෂික කාර්ය සාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
Annual Performance Report
2022

මහජන ආරක්ෂක අමාත්‍යාංශය

பொது மக்கள் பாதுகாப்பு அமைச்சு

Ministry of Public Security

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2022

මහජන ආරක්ෂක අමාත්‍යාංශය

14 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර,

බත්තරමුල්ල.

පටුන

	පිටු අංකය
01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01 - 05
1.1 හැඳින්වීම	01
1.2 දැක්ම, මෙහෙවර, අරමුණු	02 - 03
1.3 ප්‍රධාන කාර්යයන්	04
1.4 සංවිධාන සටහන	05
1.5 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන	05
02. පරිච්ඡේදය - විශේෂ, ජයග්‍රහන අභියෝග හා ඉදිරි දැක්ම	06 -11
03. පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශන	12 - 18
04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක	18
05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු	19 - 21
06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ	21
විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව	22 - 31
07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව	32 - 38

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2020.11.20 දිනැති අංක 2202 /25 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අභ්‍යන්තර ආරක්ෂක අංශයේ විෂය පථය සංශෝධනය කරමින් කැබිනට් අමාත්‍යාංශයක් ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශය පිහිටුවනු ලැබීය. එදින සිට මහජන ආරක්ෂක අමාත්‍යාංශ විෂය පථය යටතේ රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව 2022 වර්ෂයට සකස් කරන ලද සැලසුම්වලට අනුව රට තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක විය.

එමෙන්ම 2022 අප්‍රේල් මස 28 දිනැති අංක 2277/53, එමෙන්ම 2022 මැයි මස 27 දින අංක 2281/41 හා 2022 ජූලි මස 22 දිනැති අංක 2289/43 යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍ර මඟින් අමාත්‍යාංශිය විෂය පථය සංශෝධනය විය. තවද වර්ෂ 2022 ඔක්තෝබර් මස 05 වන දින අංක 2300/24 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථය නැවතත් සංශෝධනය වී පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ආගමන විගමන දෙපාර්තමේන්තුව හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය අමාත්‍යාංශය යටතට පත් විය.

සියලු රට වැසියන්ට බියෙන් සැකෙන් තොර දේශයක් බිහිකරලීමේදී මත්ද්‍රව්‍ය උවදුර, සංවිධානාත්මක අපරාධ, මංකොල්ලකෑම්, ළමා අපයෝජන හා ස්ත්‍රී දූෂණ සමාජයෙන් තුරන්කිරීමට කටයුතු කිරීම අමාත්‍යාංශයට පැවරී ඇති සුවිශේෂී ප්‍රමුඛතාවන් අතර ප්‍රධාන තැනක් ගනී. මේ සම්බන්ධයෙන් ගම කේන්ද්‍රීය කරගනිමින් මහජන ආරක්ෂක කමිටු පිහිටුවා මහජන ආරක්ෂාව තහවුරු කිරීමටත්, මහජනතාවට සමීප පොලිස් සේවයක් ලබා දීම සඳහාත් කටයුතු කරමින් සිටී.

එමෙන්ම රට තුළ මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන ජීවිතහානි, ආබාධිත තත්ත්වයට පත්වීම් හා දේපළහානි අවම කරමින් විධිමත් රථ වාහන ධාවන පාලන සැලැස්මක් ස්ථාපිත කිරීම ද අප අමාත්‍යාංශයට පැවරී ඇති ප්‍රමුඛ කාර්යයකි. නවීන තාක්ෂණය සමඟ ඩිජිටල්කරණය තුළින් ඵලදායී හා ගුණාත්මක සේවාවක් ජනතාව වෙනුවෙන් ලබාදීමටත් දැනට සිදුවන රිය අනතුරු අවම කර ගැනීමටත් අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් හඳුනාගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

රටේ සැම පෙදෙසකටම සිය සේවාවන් සපයමින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හැදුනුම් පත් නිකුත් කිරීමේ කාර්යය හා සම්බන්ධ කටයුතු කරගෙන යනු ලැබේ. ස්වකීය කාර්යයන් මනා කාර්යක්ෂමතාවයකින් ඉටු කරමින් ආගමන හා විගමන දෙපාර්තමේනතුව ගමන් බලපත්‍ර සහ වීසා නිකුත් කිරීමට අදාළ කාර්යයන් රැසක් ද ඉටු කරනු ලබයි.

එසේම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් අන්තරායකර ඖෂධ දුර්භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වූ ජාතික ප්‍රතිපත්ති සමාලෝචනය, අනිසි මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම හා පාලනය කිරීමට විවිධ ආයතන හා දෙපාර්තමේන්තුවලට සහාය දක්වමින් සිය සේවාවන් සපයනු ලබයි. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරීව පවතින සියළුම රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය ප්‍රතිපත්තීන් තුළ එකී සංවිධාන ක්‍රියාත්මක වන බව නිශ්චය කිරීම රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලබයි.

සමස්තයක් ලෙස සලකා බැලීමේදී රටේ අභ්‍යන්තර ආරක්ෂාව සුරක්ෂිත කිරීම, පොලිස් සේවයේ සේවා මට්ටම ඉහළ නැංවීම, මත්ද්‍රව්‍යවලින් සමාජය නිදහස් කරගැනීම, අන්තවාදය හා ත්‍රස්තවාදය තුරන්කිරීම, පාතාල ක්‍රියා ඇතුළු අපරාධ මැඩපැවැත්වීම, ක්‍රමවත් රථවාහන ධාවන නියාමන ක්‍රමවේදයක් ඇතිකිරීමට සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට ක්‍රියා කරන ලදි. එමෙන්ම මහජන සේවාවන් සපයනු ලබන ආයතන සඳහා ද එම සේවාවන් කාර්යක්ෂමව සිදු කරලීම සඳහා අවශ්‍ය සහය රේඛීය අමාත්‍යාංශය ලෙස ලබා දෙමින් ආයතනික කාර්ය සාධනය පවත්වා ගැනීම සඳහා ප්‍රමුඛ කාර්යයන් ඉටුකිරීම පිණිස ප්‍රතිපත්ති හා මග පෙන්වීම ලබා දෙමින් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මෙහෙයවීම සඳහා 2022 වර්ෂයේ විශාල කාර්යය භාර්යයක් ඉටු කරන ලදි.

1.2. දැක්ම

"ශ්‍රී ලංකාව සුරක්ෂිතම, ආරක්ෂිත සහ සාමකාමී දේශයක් බවට පත් කිරීම"

1.2. මෙහෙවර

"අපරාධ අවම කිරීම තුළින් මහජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම සහ අපගේ ප්‍රජාව සමඟ සහයෝගයෙන් විශ්වාසනීයත්වය ගොඩනගා ආරක්ෂිත ශ්‍රී ලංකාවක් නිර්මාණයට, ශක්තිමත් බහුපාර්ශව කරුවන්ගේ යාන්ත්‍රණයක් තුළින් මහජන ආරක්ෂාව සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සහ උපායමාර්ගික සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම"

1.2 අරමුණු

- සියලුම රටවැසියන්ට බියෙන් හා සැකෙන් තොරව නිදහසේ ජීවත්වීමට සුදුසු පරිසරයක් බිහිකිරීම සඳහා මහජන ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා මගපෙන්වීම.

- පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩිදියුණු කිරීමට නවීන තොරතුරු තාක්ෂණික උපාංග හා පුහුණුව ලබාදීම මඟින් පොලිස් නිලධාරීන්ගේ වෘත්තීයමයභාවය ඉහළනැංවීම.

- ජන ජීවිතය සුරක්ෂිතව පවත්වා ගෙන යාමට හැකිවන පරිදි අන්තවාදය, ත්‍රස්තවාදී කටයුතු, මංකොල්ලකෑම්, මිනීමැරුම්, පාතාල ක්‍රියා, මත්ද්‍රව්‍ය උවදුර විනාශ කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා පොලීසියේ බුද්ධි අංශය හා ක්‍රියාකාරී කොට්ඨාශ ශක්තිමත් කර පවත්වාගෙනයාම.

- ශ්‍රී ලංකා පොලීසියේ යටිතල පහසුකම් සංවර්ධනයට, අදාල සැලසුම් සකස්කර එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අධීක්ෂණ හා පසුවිපරම් ක්‍රියාවලිය ශක්තිමත්ව පවත්වාගෙනයාම.

- රථවාහන භාවිතය මඟින් සිදුවන අනතුරු, ආබාධිත තත්ත්වයන්, මරණ අවම කරගැනීම උදෙසා රථවාහන හැසිරවීම පාලනය හා නියාමනයට නවීන තාක්ෂණික යෙදවුම් හා භාවිතයන් හඳුන්වාදීම.

- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරීව පවතින සියළුම රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය ප්‍රතිපත්තීන් තුළ එකී සංවිධාන ක්‍රියාත්මක වන බව නිශ්චය කිරීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුගේම තොරතුරු විද්‍යුත් මධ්‍ය දත්ත ගබඩාවක, ජාතික පුද්ගල නාම ලේඛනයක් ලෙස ස්ථාපිතකර, හිමිකම් සහිත පුරවැසියන් හඳුනාගැනීම උදෙසා, විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කරමින් නෛතික දත්ත හුවමාරු පද්ධතියක් තුළ අනෙකුත් ආයතන සමඟ තොරතුරු හුවමාරු කර ගනිමින්, ජාතික ආරක්ෂාව හා ආර්ථික සංවර්ධනය උදෙසා පහසුකම් සැලසීම.

- ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතිය සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්ථා සලසමින් රටින් බැහැරවන්නන් හා ඇතුළුවන්නන් නියාමනය කිරීම සහ පුරවැසි සේවා සැපයීම.

- අදාළ සියලු ආයතන, ප්‍රජාව සහ පුද්ගලයින් බල ගැන්වීමෙන් ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ සාමකාමී සමාජයක් සහතික කිරීමට නායකත්වය ලබා දීම

1.3. ප්‍රධාන කාර්යයන්

1. මහජන ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවා මට්ටම ඉහළ නැංවීම.

2. සමාජය මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් කර ගැනීමේ වැඩපිළිවෙල ප්‍රජා මට්ටමෙන් මෙන්ම පාසල් හා අධ්‍යාපන ආයතනවල දරුවන් රාජ්‍ය හා පෞද්ගලික සේවා ස්ථාන ඉලක්කගත වැඩසටහන්, ආගමික මධ්‍යස්ථාන, සමාජ සංවිධාන රාජ්‍ය හා පෞද්ගලික අංශ සමගින් ක්‍රියාත්මක කිරීම.

3. අභ්‍යන්තර ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් අන්තවාදය හා ත්‍රස්තවාදී කටයුතු වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.

4. ජන ජීවිතය සුරක්ෂිතව පවත්වා ගැනීම සඳහා මංකොල්ලකෑම්, මිනිමැරීම්, සමාජ විරෝධී ක්‍රියාවන් හා අපරාධ මර්දනය කිරීම හා මැඩපැවැත්වීම.

5. රටේ සියළුම පුරවැසියන්ට, විශේෂයෙන්ම කාන්තාවන්ට හා දරුවන්ට නිදහසේ තම ජීවිත ගත කිරීමට අවශ්‍ය රැකවරණය පවත්වාගෙන යෑම.

6. රථ වාහන භාවිතයේදී මාර්ගවල සිදුවෙන අක්‍රමිකතා මෙන්ම මාර්ග අනතුරු සිදුවන මරණ, අබාධ, රෝහල් ගත වීම් වලක්වා ගැනීම හා අවිධිමත් හා නොසැලකිලිමත් රිය පැදවීම් මංතීරු හා මාර්ග සංඥා උල්ලංඝනය කිරීම මෙන්ම විශේෂයෙන් නාගරික ප්‍රදේශවල අවිධිමත් රිය පැදවීම හා මග දෙපස රථ වාහන නතරකර තැබීම් නිසා ඇතිවන මාර්ග තදබදය අවම කර ක්‍රමවත් රථවාහන ධාවන නියාමන ක්‍රමවේදයක් හා නීතිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම සඳහා රථවාහන පොලිසිය ප්‍රතිසංවිධානය කර නවීන තාක්ෂණ හා ක්‍රමෝපායන් යොදාගනිමින් නවිකරණය කිරීම.

7. ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ රාජ්‍ය නොවන සංවිධනවල කාර්යයන් සම්බන්ධීකරණය කරමින් රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක වීමට අවස්ථාව සැලසීම.

8. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කටයුතු

9. ආගමන හා විගමන කටයුතු

10. අන්තරායකර ඖෂධ භාවිතය වැලැක්වීම හා පාලනය

1.4. සංවිධාන සටහන



1.5 අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන

මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පහත ආයතන ක්‍රියාත්මක වේ.

i. ශ්‍රී ලංකා පොලීසිය
ii. විශේෂ කාර්ය බලකාය
iii. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
iv. ආගමන විගමන දෙපාර්තමේන්තුව
v. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
vi. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

➢ මානව සම්පත් සංවර්ධනය

2020.11.20 දිනැති අංක 2202 /25 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අභ්‍යන්තර ආරක්ෂක අංශයේ විෂය පථය සංශෝධනය කරමින් කැබිනට් අමාත්‍යාංශයක් ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශය පිහිටුවන ලදි. නිලධාරීන් 123 කින් සමන්විත වූ අභ්‍යන්තර ආරක්ෂක අංශයේ කාර්ය මණ්ඩලය නව කැබිනට් අමාත්‍යාංශය සඳහා ප්‍රමාණවත් නොවූ බැවින්, 2021.06.10 වන දින ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරක් ද සමඟ තනතුරු 126 කින් යුතු නව කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදි. ඒ අනුව සමස්ත කාර්ය මණ්ඩල අවශ්‍යතාවයෙන් 90% ක් 2022 වර්ෂය අවසාන වන විට සම්පූර්ණ කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර එම කාර්ය මණ්ඩලය මඟින් අමාත්‍යාංශයේ කාර්යභාරය හැකි උපරිම කාර්යක්ෂමතාවයකින් පවත්වා ගෙන යනු ලබයි.

එසේම 2022.10.05 දිනැති අංක 2300/24 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පොලිස් සේවාව මගින් ඉටු කලයුතු සුවිශේෂීවූ භාරධුර කාර්යයන්ට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යන ආයතනද මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතට පත් කර ඇත.

➢ විශේෂිත වූ කාර්යන් විධිමත්ව ඇරඹීම උදෙසා...

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ හා ඒ යටතේ ඇති ආයතනවල සිදුකරනු ලබන කාර්යයන් විධිමත්ව හා විනිවිදභාවයකින් යුතුව නෛතික රාමුවක් තුළ සිදුකිරීම සඳහා මානව සම්පත් වර්ධනය, සුභසාධනය ඉහළනැංවීම, යටිතල පහසුකම් සංවර්ධනය ආදී විවිධ කාර්යයන් පාදක කර ගනිමින් සමාලෝචිත කාලය තුළ අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 13 ක් ඉදිරිපත් කර ඇත. එම පත්‍රිකා සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතීන් හා නිර්දේශයන් අනුව අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල කාර්යයන් විධිමත්ව සිදු කිරීම සඳහා අවශ්‍ය පියවරයන් ක්‍රියාත්මක මට්ටමේ පවතී.

➢ පොලිස් සේවය විධිමත් කිරීම උදෙසා...

මූලස්ථාන පොලිස් පරීක්ෂක / පොලිස් ස්ථානාධිපති තනතුරු සඳහා නිලධරයන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය 2022 වර්ෂයේ පැවැත්වීමේ කටයුතු සිදු කර එමගින් තෝරා ගන්නා ලද නිලධාරීන් 1,116 දෙනෙකු සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් මඟින් කාර්යය සාධන වාර්තා කැඳවා එම කාර්යය සාධන වාර්තා පදනම් කර ගෙන සුදුසුකම් ලත් නිලධරයන් 1,025 කගේ නාම ලේඛනයක් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර ඇති අතර, ඒ පිළිබඳ සැහීමකට පත් නොවන නිලධාරීන් සඳහා අභියාචනා මණ්ඩලයක් පවත්වා 2022.11.20 දිනැති අංක 2202/24 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සිදුකරන ලද බලතල පැවරීම ප්‍රකාරව පොලිස් ස්ථාන 260ක් සඳහා මූලස්ථාන පොලිස් පරීක්ෂක/පොලිස් ස්ථානාධිපති ධූරයන්හි පත්කිරීම් හා ස්ථාන මාරුකිරීම් සිදු කිරීමට කටයුතු කර ඇත.

• නිරවුල් මනසින් - සේවය සතුටින්...

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය අනුග්‍රහයෙන් නිලධාරීන්ගේ කායික හා මානසික සෞඛ්‍ය ඉහල නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩමුළුවේ පළමු සැසිය 2022.09.06 දින සාර්ථකව පැවැත්විණි. 2 වන අදියර පොලිස් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ද 3 වන අදියර 2022.12.28 දින සිවිල් රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ද ක්‍රියාත්මක කරන ලදී.



- **ශ්‍රී ලංකා පොලීසිය සඳහා විශ්ව විද්‍යාලයක්...**

මහජන ආරක්ෂාව, සාමය හා සංහිඳියාව පිළිබඳ රජයේ අරමුණු මුදුන්පත් කිරීමට විධිමත් උසස් අධ්‍යාපන යෙදවුම් ඔස්සේ පොලිස් සේවයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන පොලිස් විශ්ව විද්‍යාලය ස්ථාපනය කිරීමේ ප්‍රථම අදියර වශයෙන් පොලිස් අභ්‍යාස විද්‍යාලය කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට අනුබද්ධ කර අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇති අතර පොලිස් නිලධාරීන් වැඩි පිරිසකට අධ්‍යයන කටයුතු සිදු කර ගත හැකි වන පරිදි ධාරිතාව වැඩි කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

- **මත් ද්‍රව්‍ය භාවිත රියදුරන් හඳුනා ගැනීමට පරීක්ෂණ කට්ටල...**

මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පැදවීම හේතුවෙන් දෛනිකව ඉහල යන මාරක රිය අනතුරු නිසා සිදු වන මරණ ගණන හැකිතාක් අවම කර මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පැදවීම මුළුමනින්ම නවතා දැමීමේ අරමුණින් රියදුරන් ක්ෂණිකව පරීක්ෂාකර මත්ද්‍රව්‍ය භාවිත කර රිය පදවන්නන් හඳුනා ගනිමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මෙම ව්‍යාපෘතිය හඳුන්වා දී ඇත. එහි පළමු අදියර යටතේ අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය හරහා පරීක්ෂණ කට්ටල ලබා ගැනීම සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදලින් රු.මිලියන 10 ක අරමුදල් වෙන් කරගෙන එම පරීක්ෂණ කට්ටල මිලදී ගෙන ඇති අතර, ශ්‍රී ලංකා පොලීසියට ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිතා කර රිය පදවන රියදුරන් මාර්ගබදව පරීක්ෂා කිරීමේ නියමු ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය වාර්තාව සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

- **ශ්‍රී ලංකාව තුළ ළමා අපචාර හා අපයෝජන තුරන් කරමින්...**

ළමා අපචාර හා අපයෝජන වැළැක්වීම සඳහා ස්ථිරසාර විසඳුමක් ලබා දීමේ අරමුණින් ශ්‍රී ලංකා පොලීසිය සහ ළමා අපචාර සම්බන්ධව කටුයතු කරනු ලබන සියලුම ආයතන ඒකාබද්ධ කරමින් යාන්ත්‍රණයක් සකස් කිරීම මෙහි අරමුණ වේ. මේ සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මෙහෙය වීම යටතේ ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලිසිය,ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සහ අදාල වෙනත් අංශ සම්බන්ධ කර ගනිමින් ළමා අපචාර මැඩ පැවැත්වීම සම්බන්ධ තීන්දු තීරණ ගනිමින්, හා ඊට අදාළ ක්‍රියාමාර්ගයන් වෙත යොමු වෙමින් පවතී. මීට අමතරව දිවයින පුරා ළමුන්ට සිදුවන අපචාර ක්‍රියා සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ස්වාධීන ඒකකයක් ලෙස විශේෂ පොලිස් විමර්ශන ඒකකය පිහිටුවන ලද අතර එමඟින් ළමා අපචාර වැළැක්වීමේ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කිරීමට දායක වේ.



- **පොලිස් බල ප්‍රදේශ සිතියම් ගත කරමින්...**

පොලිස් බල ප්‍රදේශ සිතියම් ගත කොට එම පොලිස් බල ප්‍රදේශයන් සරල මෘදුකාංගයක් භාවිතා කොට නිශ්චිත වශයෙන් හඳුනා ගැනීම සඳහා මහජනතාව වෙත පහසුකම් සැලසීම මෙහි අරමුණ වේ. දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙහි නියමු ව්‍යාපෘතියක් වශයෙන් කළුතර දිස්ත්‍රික්කයේ පොලිස් බල ප්‍රදේශ මට්ටමින් පවතින මායිම් සම්බන්ධ ගැටළු හඳුනාගෙන සිතියම් ගත කිරීම් කටයුතු මේ වන විටත් අවසන් කොට ඇති අතර මුළු දිවයිනම ආවරණය වන පරිදි අනෙකුත් ආයතන සම්බන්ධ කර ගනිමින් අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා පොලිසියේ පූර්ණ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ මෙම කාර්ය ඉටු කරනු ලබයි.

- **ස්ථානීය ක්ෂණික දඩ මුදල් අය කිරීම පිණිස...**

රියදුරු මාර්ග විනය ඇති කිරීම උදෙසා රියදුරු අවාසි සහගත ලකුණු ක්‍රමය සහ රථවාහන මාර්ග නීති උල්ලංඝනය වූ අවස්ථාවලදී උසාවියට ඉදිරිපත් නොකරන වැරදි ක්ෂණික දඩ මුදල් එකතු කිරීමේ පුළුල් ඒකාබද්ධ ඉලෙක්ට්‍රොනික විසඳුමක් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය, මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ අදාල සියලුම ආයතන ඒකාබද්ධව අදියර 03 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති යෝජනාව සකස් කර ඇති අතර වර්තමාන මිල ගණන් යටතේ නැවත වියදම් ඇස්තමේන්තු සකස් කර ඇති අතර රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ඇත.

- **සේවය අතහැර ගිය නිලධාරීන් නැවත සේවයේ පිහිටුවමින්...**

අමාත්‍ය මණ්ඩල අනුමැතිය තුළින් ශ්‍රී ලංකා පොලීසියේ හා විශේෂ කාර්ය බලකායේ සේවය අතහැර යාමේ නියෝග ලබා සිටි පොලිස් නිලධරයන් 2,297 න් නිලධරයන් 1,039 ක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කර එයින් සුදුසුකම් ලත් නිලධරයන් 910 ක් නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන ලදි. ඊට අමතරව සුදුසුකම් ලත් තවත් නිලධාරීන් 63 ක් නැවත සේවයේ පිහිටු වීම සඳහා නිර්දේශ කරමින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇත.

2.1. මහජන දුක්ගැනවිලි කඩිනමින් සමනය කිරීම පිණිස...

- **118 හදිසි ඇමතුම් සේවාව**

2014 වර්ෂයේ ආරම්භ කර ඇති 118 හදිසි ඇමතුම් මැදිරියේ මූලික පරමාර්ථය වී ඇත්තේ රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් හා ත්‍රස්ථ ක්‍රියා සම්බන්ධයෙන් වන තොරතුරු ලබා ගැනීමය. ඊට අමතරව ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ නිලධාරීන්ට විරුද්ධව යොමු වන පැමිණිලි සඳහා කඩිනම් විමර්ශන සිදු කිරීමටත්, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොරතුරු හා පාතාල ක්‍රියාකාරකම් වැනි තොරතුරු ලබා ගැනීමත් මේ තුළින් සිදු කර ඇත. එමෙන්ම කාලීනව මහජන පැමිණිලි, යෝජනා, චෝදනා, දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශයත් ශ්‍රී ලංකා පොලීසියත් එක්ව ක්‍රමවේදයන් කිහිපයක් අනුගමනය කරනු ලැබේ. මේ යටතේ අමාත්‍යාංශය මඟින් 118 දුරකථන අංකය ඔස්සේ පැමිණිලි ක්ෂණිකව ලබා ගත හැකි හදිසි ඇමතුම් සේවාවක් පැය 24 තුළදීම ක්‍රියාත්මක කෙරේ. එමඟින් 2022 වසර තුළ ලද අපරාධ, රථ වාහන, දුෂණ වැටලීම්, ආරවුල්, වෙනත් ආදී වශයෙන් පැමිණිලි 47,236 ක් ලැබී ඇති අතර ඒ සෑම පැමිණිල්ලක්ම විසඳීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. 118 ජාතික සේවා මැදිරිය 2022.09.03 දින සිට නව තාක්ෂණික මෙවලම් භාවිතයෙන් හදිසි ඇමතුම් හා මහජන පැමිණිලි ඒකකය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ අමාත්‍යාංශ පරිශ්‍රයේ ක්‍රියාත්මකව පවතී.



- **පොලිස් හා මහජන දුක් ගැනවිලි විසඳීමට ක්‍රියා කරමින්..**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන ආයතන මඟින් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ හෝ ක්‍රියාත්මක නොවූ කරුණු සම්බන්ධයෙන් සහන ලබා ගැනීම, රාජ්‍ය ආයතන හා නිලධාරීන්ට විරුද්ධව පැමිණිලි හා චෝදනා යොමු කිරීම යනාදිය සඳහා මහජනතාවට අවස්ථාව ලබා දෙමින් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ලේකම්තුමා, අමාත්‍යාංශ නිලධාරීන් හා ශ්‍රී ලංකා පොලීසිය ඇතුළු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා එක්ව 2022 වර්ෂය තුළ සෑම සඳුදා

දිනකම මාර්ගගත ක්‍රමය ඔස්සේ මහජන දින පවත්වා ඇත. එහිදී පොලිස් නිලධාරීන් විසින් ඉදිරිපත් කළ අභියාචනා හා දුක්ගැනවිලි 465 ක්ද, පොදු මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව 120 ක් සඳහා විසඳුම් ලබා දීමට හැකියාව ලැබී ඇත. ඒ අනුව යොමු වී ඇති සියළුම දුක්ගැනවිලි සඳහා විසඳුම් ලබා දීමට හැකි වී තිබේ.

➢ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම



2022 වර්ෂයේ විගණන සැලැස්මට අනුව පළමු, දෙවන, තෙවන හා සිව්වන කාර්තු සඳහා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන ලදි. ඒ තුළින් වාර්ෂික සැලසුම් වලට අනුකූලව කාර්තුමය ඇගයීම් සමාලෝචනය කිරීමට හැකි වීය. එමෙන්ම විගණන විමසුම් වලින් ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් නොවිසඳුනු ගැටළු විසඳා ගැනීමටත්, ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇගයීමට ලක් කිරීමට හැකි වී ඇත.

2.2 සංවර්ධන වැඩසටහන් අධීක්ෂණ කටයුතු සිදු කරමින්...

ශ්‍රී ලංකා පොලිසිය හා විශේෂ කාර්ය බලකාය විසින් වාර්ෂික ප්‍රාග්ධන ප්‍රතිපාදනවලට අදාළ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය කාර්තුමය ලෙස සමාලෝචනය කිරීමේ රැස්වීම් පවත්වන ලදි. විශේෂයෙන්ම ඉදිකිරීම් හා භාණ්ඩ මිලදී ගැනීම් ව්‍යාපෘතිවල ගැටලු ඇති වූ අවස්ථාවලදී අදාළ පාර්ශවයන් කැඳවා එම ගැටලු නිරාකරණයට අවශ්‍ය උපදෙස් හා ක්‍රියාමාර්ග ගනු ලැබිණි. එසේම කොන්ත්‍රාත්කරුවන්ගේ අකාර්යක්ෂමතාවය මත ව්‍යාපෘති ක්‍රියාත්මක වීම අඩාල වූ ව්‍යාපෘතිවල ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකා සිදු කර අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට විධිවිධානද සලස්වන ලදි.



- **අයවැය යෝජනා වැඩසටහන ක්‍රියාත්මක කරමින්...**

2022 වසර සඳහා අයවැය තුළින් අමාත්‍යාංශයට වෙන්වන ප්‍රතිපාදනවලට අමතරව විශේෂ අයවැය යෝජනාවක් ලෙස රු.මි. 500 ක ප්‍රතිපාදනයක් ලබාදෙන ලදි. එමගින් ග්‍රාමීය මට්ටමෙන් ආරම්භ කෙරෙන ප්‍රජා පොලිස් සේවාවන්ට අවශ්‍ය පහසුකම් හා පොලිස් නිලධාරීන් බඳවා ගැනීම සඳහා මෙම ප්‍රතිපාදන වෙන් කර දී ඇත. එම ප්‍රතිපාදනයන් උපයෝගී කර ගෙන එවකට පැවති ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේ මූලික කටයුතු සිදු කරන ලදි.

ඒ අනුව අයවැය යෝජනා යටතේ ප්‍රජා පොලිස් නිලධාරීන් සඳහා පා පැදි ලබා දීමේ ව්‍යාපෘතිය සඳහා රු. මි. 40 ක් ද, පොලිස් කොට්ඨාශ 27 ක් සඳහා බහු ප්‍රක්ෂේපන යන්ත්‍ර 27 ක් ලබා දීම සඳහා රු.මි. 10 ක් ද, ප්‍රජා පොලිස් නිලධාරීන් සඳහා කාර්යාල උපකරණ ලබා දීම සඳහා රු.මි. 50 ක් ද, ග්‍රාම නිලධාරී වසම තුළ දැනට ඉදි කර ඇති සේවා පියස තුළ ප්‍රජා පොලිස් නිලධාරීන් සඳහා කාර්යාල පහසුකම් සකස් කර දීම සඳහා රු.මි. 400 ක් ද යොදා ගෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මූලික අනුමැතිය ගෙන කටයුතු කරමින් සිටින ලදි. නමුත් රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් වන අයවැය චක්‍රලේඛ අංක 03-2022 සහ අංක 22/0508/414/003 දරන 2022.05.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉහත ව්‍යාපෘති සියල්ලම ක්‍රියාත්මක කිරීම තවකාලිකව නතර කරන ලදි.

2.3 අන්තර් ජාතික සහයෝගීතාවය ලබා ගනිමින්...

- මහජන ආරක්ෂක අමාත්‍යාංශය පිහිටු වීමෙන් පසු ගරු අමාත්‍යතුමා ප්‍රථමයෙන්ම ඒ හා බැඳුණු භාරධූර වගකීම හා කාර්යය භාර්යය ඉටු කිරීම සඳහා විවිධ පාර්ශවයන්ගේ සහයෝගය ලබා ගැනීම වෙනුවෙන් සාකච්ඡා පවත්වන ලදි. ඒ අතර විදේශ නියෝජිතයින් හා අන්තර් සම්බන්ධීකරණයන් අවශ්‍ය අමාත්‍යාංශවල අමාත්‍යවරුන් සමඟ ද සාකච්ඡා පවත්වන ලදි.

  එමෙන්ම නීතිය හා සාමය පවත්වාගෙන යාම උදෙසා ශ්‍රී ලංකා පොලීසියේ කාර්යභාරය, කාර්යක්ෂම හා ඵලදායී කිරීමට කටාර් රාජ්‍යය, වියට්නාමය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඔස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව, රුසියාව, තජිකිස්ථානය, බ්‍රසීලය, පකිස්තානය, මැලේසියාව, පිලිපීනය යන රටවල සහ අන්තර්ජාතික රතු කුරුස කමිටුව සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම හා ගිවිසුම් අත්සන් තැබීමට අදාළ කටයුතු ක්‍රියාත්මක කරමින් සිටී.

- ශ්‍රී ලංකාවේ නවසීලන්ත තානාපති මයිකල් එඩ්වඩ් මහතා හා ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමා අතර හමුවක් පැවැත්වූ අතර එහිදී දෙරට අතර ද්වීපාර්ශික සබඳතා තවදුරටත් වැඩි දියුණු කිරීම හා ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමට තනාපති වරයා එකඟතාවය පළ කරන ලදි.



- ද්වීපාර්ශික සබඳතා ශක්තිමත් කිරීම, ශ්‍රී ලංකාවේ ආරථික අර්බුදකාරී තත්වයෙන් මිදීම සඳහා ගත යුතු කියාමාර්ග පිළිබඳව මහජන ආරකෂක අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා සමඟ චීන තානපති වී.ශෙන්ග් හොන්ග් මහතා හමුවී සාකච්ඡා කරන ලදි. එමෙන්ම ඉදිරි කටයුතු සඳහාද චීන රජයේ උපරිම සහයෝගය ලබා දෙන බවද දැන්වීය.



- ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බග්ලේ මහතා හා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය ටිරාන් අලස් මහතා අතර හමුවක් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේදී සිදු වීය. එහිදී දෙරට අතර ඇති සබඳතා ශක්තිමත් කර ගැනීම පිළිබඳව සාකච්ඡා කරන ලදි. එමෙන්ම මෙරට වත්මන් ආර්ථික, සමාජ තත්වය පිළිබඳව සාකච්ඡා කල අතර ආර්ථිකය යතාවත් කර ගැනීම සඳහා ලබා දිය හැකි විසදුම් සම්බන්ධයෙන්ද වැඩිදුරටත් අදහස් හුවමාරු කර ගන්නා ලදි.



- පොදුරාජ්‍ය හා සංවර්ධන කාර්යාලයේ ඉන්දු පැසිෆික් කලාපීය අධ්‍යක්ෂ සහ ඉන්දියාවේ අධ්‍යක්ෂ බෙන් මෙලර් සහ ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් සාරා හල්ටන් මහත්මිය අතර හමුවක් සිදු වූ අතර එහිදී ශ්‍රී ලංකා පොලිසිය ජන ඒකරාශී වීම් පාලනය කිරීමේදී කිසිදු පාර්ශවයක් අගතියට පත් නොවන ආකාරයෙන් ක්‍රිය කිරීම සම්බන්ධයෙන් බෙන් මෙලර් මහතා අගය කරමින් වැඩිදුරටත් අදහස් හුවමාරු කර ගන්නා ලදි.



➢ **අමාත්‍යාංශයේ මධ්‍යකාලීන ඉලක්ක**

- පොලිස් මූලස්ථානය අවශ්‍යතාවයට ගැලපෙන අයුරින් සුදුසු ස්ථානයක ස්ථාපනය කිරීම.
- රියඅනතුරු අවම කර ලීම සඳහා ශ්‍රී ලංකා පොලීසියේ රථවාහන කොට්ඨාසය ශක්තිමත් කිරීම.
- ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය ගොඩනැගිලි හා භෞතික සම්පත් ලබා දීම
- පොලිස් නිලධාරින්ගේ උසස්වීම්, ස්ථානමාරුවීම් හා විනය සම්බන්ධ ගැටලු සඳහා විසඳුම් ලබාදීම කාර්යක්ෂම කිරීම.
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කටයුතු කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම
- ආගමන හා විගමන කටයුතු කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම
- අන්තරායකර ඖෂධ භාවිතය වැලැක්වීම හා පාලනයට ක්‍රියා කිරීම

➢ **විදේශ ආධාර මත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති**

- **ප්‍රවාහන පහසුකම් වැඩි කිරීම පිණිස...**

ඉන්දීය රජයේ ණය ආධාර යටතේ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් ස්ථානවලට හා කොට්ඨාශවලට ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් ලබාදීම සඳහා ජීප් රථ 500 ක් ලබා ගැනීමේ ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස ජීප් රථ 125 ක් 2022.12.22 දින ඉන්දියානු මහකොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා විසින් ලබා දෙන ලදි.





03. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

රු.

අයවැය 2022		සටහන	තත්‍ය 2022 (රු.)	තත්‍ය 2021 (රු.)	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		10,550,696,000	9,436,780,000	ඒසීඒ-3
-	තැන්පතු		21,801,818	57,009,619	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		67,372,346	72,104,783	ඒසීඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**10,639,870,165**	9,565,894,401	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)				
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**10,639,870,165**	9,565,894,401	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
8,073,936,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	8,029,551,412	7,550,854,702	ඒසීඒ-2(ii)
2,619,664,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	2,276,487,344	1,768,010,593	
134,890,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	99,659,648	48,849,014	
-	පොළී ගෙවීම්	8	-	-	

-	වෙනත් පුනරාවර්තන වියදම්	9	9,059,731		
10,828,490,000	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		**10,414,758,136**	**9,367,714,309**	
	මූලධන වියදම්				
234,655,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	109,063,043	49,050,012	
518,995,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	202,982,036	165,864,554	
3,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	2,855,856		**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-		
9,490,000	හැකියා වර්ධනය	**14**	9,446,971	8,326,505	
500,000,000	වෙනත් මූලධන වියදම්	**15**	535,203,817	226,249,342	
1,266,140,,000	**මුළු මූලධන වියදම් (ඵ)**		**859,551,723**	**449,490,413**	
	තැන්පතු ගෙවීම්		13,939,539	21,154,813	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		67,945,220	114,317,403	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-		
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)			**136,472,216**	
	මුළු වියදම් එ = (ඊ+ඵ+ඌ)		11,356,194,617	9,953,676,939	
-	**දෙසැම්බර් 31 දිනට අඟ්‍රිම ශේෂය ඒ = (ඉ-එ)**		(716,324,453)	(387,782,538)	
	අඟ්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(716,324,453)	(387,782,538)	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අඟ්‍රිම ශේෂය		-		**ඒසිඒ-3**
			(716,324,453)	(387,782,538)	

3.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022.12.31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

	සටහන	තත්‍ය	
		2022	**2021**
	-	රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	8,290,262,957	7,887,729,205
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	42,785,494	42,212,620
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	
මුළු වත්කම්		**8,333,048,451**	**7,929,941,825**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		64,409	7,357,815
දේපළ පිරියත හා උපකරණ සංචිතය			
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	8,290,262,957	7,887,729,205
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	42,717,085	34,854,805
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	
මුළු වගකීම්		**8,333,048,451**	**7,929,941,825**

3.2. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022 රු.	නැවත ගලපන ලද 2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	258,671,484	243,481,030
අග්‍රිම ලැබීම්	10,568,545,496	9,436,780,000
අත්තිකාරම් අයකර ගැනීම්	73,688,413	119,602,217
තැන්පතු ලැබීම්	22,801,828	22,011,555
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**10,922,707,212**	**9,821,874,803**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	10,120,133,563	9,239,281,598
සහනාධාර සහ මාරුකිරීම්	94,587,990	48,302,409
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	(118,618,873)	(42,237,330)
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	68,108,547	111,956,399
තැන්පතු ගෙවීම්	13,939,593	22,154,813
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**10,178,150,765**	**9,379,457,889**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**744,556,446**	**442,416,913**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	442,416,913
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	744,556,446	442,416,913
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	744,556,446	442,416,913
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(744,556,446)	(442,416,913)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		**(0)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උෟ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උෟ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.3. මූල්‍ය ප්‍රකාශ සටහන

පිටු අංක 12 සිට 16 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 17 සිට 18 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.



3.4. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.'000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නොවේ					

3.5. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.'000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	10,828,490	10,828,490	10,414,758	96.%
ප්‍රාග්ධන	1,266,140	1,266,140	859,552	68%

3.6. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.'000

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදි ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	-	1,427,144		
9152	යන්ත්‍රෝපකරණ	-	3,577,128		
9153	ඉඩම්	-	2,607,061		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	939		
9160	කෙරීගෙන යන වැඩ	-	677,991		

04. පරිච්ඡේදය - කාර්ය සාධක දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
අපරාධ විසඳීමේ ප්‍රතිශතය		76%	
විශේෂ කාර්ය බලකාය දායක්වය සැපයු වැටලීම් ගණන	95%		
ක්‍රියාකාරී මහජන ආරක්ෂක කමිටු හා ක්‍රියාත්මක කළ දැනුවත් කිරීම් වැඩසටහන් ගණන			58%

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක, දර්ශක

අරමුණු	ඉලක්ක	දර්ශක	මේ දක්වා ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
අරමුණ 03. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.	3.4 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ,ප්‍රතිකාර මගින් හා වළක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	3.4.2 සියදිවිනසා ගැනීම් හේතුවෙන් මිය යන ප්‍රමාණය (සම්පූර්ණ ජනගහණය මත පදනම්ව)	15%		
	3.6 2030 වන විට මහාමාර්ග වල සිදුවන අනතුරුවලින් සිදුවන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම.	3.6.1 මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ අනුපාතය	11%		

අරමුණු	ඉලක්ක	දර්ශක	මේ දක්වා ප්‍රගතිය			
			0%-49%		50 -74 %	75 -100 %
අරමුණ 16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.	16.1 සියලුම ස්ථානයන්හි සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් සහ ඒ ආශ්‍රිත මරණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම	16.1.1 ස්ත්‍රී පුරුෂභාවය හා වයස අනුව ජනගහනයෙන් පුද්ගලයන් 100 000කට සියදිවි නසා ගැනීම් වලට ලක්වන සංඛ්‍යාව	පුරුෂ මියගිය) (ගණන	448	0.25%		
			ස්ත්‍රී මියගිය) (ගණන	131	0.5%		
			එකතුව	579	0.27%		
		16.1.2 ස්ත්‍රී පුරුෂභාවය හා වයස අනුව ජනගහනයෙන් පුද්ගලයන් 100 000 කට ගැටුම් හා සම්බන්ධ හේතු නිසා සිදුවන මරණ සංඛ්‍යාව	-		-	-
		16.1.3 පසුගිය මාස 12 තුළදී කායික, මානසික හෝ ලිංගික හිංසනයට ගොදුරු වූ ජනගහනය ප්‍රමාණය	27%			

අරමුණු	ඉලක්ක	දර්ශක	මේ දක්වා ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
අරමුණ 16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ	16.2 ළමුන් කෲර වධහිංසා කිරීම්වලට සහ අපයෝජනය, සූරාකෑමට, කුට්ටනයට සහ	16.2.2 ස්ත්‍රී පුරුෂභාවය හා වයස උපයෝජනයේ ස්වරූපය අනුව ජනගහනයේ	4%		

සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.	සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් ට ලක්වීම අවසන් කිරීම	100,000 ක් අතරින් මිනිස් ජාවාරමෙහි ගොදුරු බවට පත්වූ පුද්ගලයන් සංඛ්‍යාව			
	16.3 සියලු දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම ජාතික හා අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම .	16.3.3 පසුගිය වසර දෙක තුළ ආරවුලක් අත්විඳ ඇති සහ විධිමත් හෝ අවිධිමත් ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයකට ප්‍රවේශ වූ ජනගහනයේ අනුපාතය	4%		
	16.4 2030 වන විට නීති විරෝධී මූල්‍ය හා ආයුධ ප්‍රවාහයන් කැපී පෙනෙන ලෙස අඩු කිරීම, සොරකම් කරන ලද වත්කම් නැවත ලබා ගැනීම ශක්තිමත් කිරීම සහ සියලුම ආකාරයේ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීම.	16.4.2 ජාත්‍යන්තර ක්‍රමෝපායන්ට නිසි බලයලත් නිලධාරියකු විසින් හඳුනාගත් හෝ තහවුරු කර ගත් අල්ලා ගන්නා ලද, සොයා ගන්නා ලද හෝ බාර දෙන ලද නීති විරෝධී සමානමයක් සහිත ආයුධ ප්‍රමාණය	1,684		

අරමුණු	ඉලක්ක	දර්ශක	මේ දක්වා ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
අරමුණ 16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.	16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම,තහවුරු කිරීම	16.10.1 පසුගිය මාස 12 තුළ මාධ්‍යවේදීන්, වෘත්තීය සමිති ක්‍රියාකාරීන් සහ මානව හිමිකම් ක්‍රියාකාරීන් මරා දැමීම, පැහැර ගැනීම්, අතුරුදහන් කිරීම් රඳවා තබා ගැනීම් සහ වධහිංසා පැමිණවීම් සම්බන්ධව පැහැදිලිව හඳුනා ගන්නා ලද අවස්ථා සංඛ්‍යාව	-	-	-

05.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකවින් විස්තර කරන්න.

1) මාර්ග අනතුරු වලින් සිදුවන මරණ සංඛ්‍යාව අඩුකිරීම මෙම අමාත්‍යාංශයට අදාළවන තිරසාර සංවර්ධන ඉලක්කයකි. ශ්‍රී ලංකාවේ මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ අනුපාතය පසුගිය වසර කීපය හා සැසඳීමේදී වැඩි වීමේ ප්‍රවණතාවයක් දක්නට හැකිය. මේ සඳහා හේතු වන සාධක ලෙස වාහන ප්‍රමාණයට ප්‍රමාණවත් වන ලෙස මාර්ග පද්ධතිය ගුණාත්මකව පුළුල් නොවීම හා රියදුරන් විනයගරුක ලෙස කටයුතු නොකිරීම ප්‍රධාන කරුනු ලෙස දැක්විය හැකිය. මෙම හේතු සාධක සඳහා පිළියම් යෙදීමට අදාල සියළු පාර්ශව සමඟ ඒකාබද්ධ ප්‍රවේශයකින් වැඩසටහන් ක්‍රියාත්මක කල යුතු වන අතර එය අභියෝගයක් ලෙස හැඳින්විය හැකිය.

2) අයහපත් සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්වයක් ගොඩනැගී පැවතීම, සියදිවි නසාගැනීම් සිදුවීමට බලපාන ප්‍රධාන සාධකය වේ. සියදිවි නසා ගැනීම් අඩු කරලීම සඳහා සමස්ථ රාජ්‍ය යාන්ත්‍රණය එම අයහපත් තත්වයන් සමනය කිරීමට ඒකාබද්ධව කටයුතු කළයුතු වේ. එය අභියෝගයක් ලෙස හැඳින්විය හැකිය.

3) තිරසර සංවර්ධන ඉලක්ක ලෙස පවත්නා අපරාධ සිදුවීම් අඩු කිරීම සම්බන්ධ දර්ශක වලින් යහපත් තත්ත්වයකට 2030 වන විට පැමිණීම මෙම අමාත්‍යාංශයට අයත් කාර්යයක් වේ. ඒ සඳහා පවත්නා නීති සංශෝධනය කිරීමටත්, නව නීති සම්පාදනය කිරීම හා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන ශ්‍රී ලංකා පොලීසියේ ආයතන ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීමටත් කටයුතු කරමින් සිටී. අපරාධ සිදුවීමට පාදක වන පසුබිම වෙනස් කිරීමට අදාළව ක්‍රියා කිරීම මෙම අමාත්‍යාංශයට පමණක් කළ නොහැකිය.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	18	14	05
තෘතියික	05	01	04
ද්විතියික	70	67	18
ප්‍රාථමික	28	27	01

තෘතියික මට්ටමේ තනතුරු වන සිංහල දෙමළ භාෂා පර්වර්තක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී, සංඛ්‍යාලේඛන නිලධාරී යන තනතුරු සඳහා නිලධාරීන් මෙතෙක් බඳවා ගැනීමට හෝ අනුයුක්ත කර ගැනීමට නොහැකි වීම මත අමාත්‍යාංශයේ ඇතැම් රාජකාරි කටයුතු සිදු කිරීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවී ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.
ජේඑල්ඕ/එව්/එම්පීඑස්/එස්ආර්/2023

මගෙ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2023 මැයි 31 දින

ලේකම්,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය

ශීර්ෂය 189 - මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 189 - මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ). 2021 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි සහ ඉදිකිරීම් කෙරිගෙන යන වැඩ ශේෂය රු.608,836,986 ක් වුව ද, 2022 ජනවාරි 01 දිනට එය රු.670,873,053 ක් ලෙස දැක්වීම හේතුවෙන් SA-82 හි රු.62,036,067 ක් ආරම්භක ශේෂය වැඩියෙන් දක්වා තිබුණි .

(ආ). 2021 දෙසැම්බර් 31 දිනට අනෙකුත් යන්ත්‍ර සහ උපකරණ ශේෂය රු.2,656,391,978 ක් වුව ද, 2022 ජනවාරි 01 දිනට එය රු.2,647,338,195 ක් ලෙස දැක්වීම හේතුවෙන් SA-82 හි රු.9,053,783 ක් ආරම්භක ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.එම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රු.202,982,036 ක මූලධන වත්කම් අත්පත් කරගෙන තිබුණ ද එය රු.139,073,445 ක් ලෙස SA-82 හි මිලදී ගැනීම් යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.63,908,591 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2. විගණනය සඳහා සාක්ෂි නොවීම

2022 අප්‍රේල් 28 දිනැති අංක 2277/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව සිදු වූ අමාත්‍ය මණ්ඩල සංශෝධනය අනුව ප්‍රජා පොලිස් රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් මෙන්ම ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යාංශයට අයත් සියලු වත්කම් සහ වගකීම් ද මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරා තිබුණි.මෙලෙස වත්කම් පැවැරීමේ දී 2022 සැප්තැම්බර් 21 දිනැති අංක 06/2022 අයවැය චක්‍රලේඛ ඡේද අංක 20,21,22 සහ 23 අනුව මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේ කටයුතු කළයුතු වුවත්, නිවැරැදිව ගිණුම්ගත කිරීම් සිදු වූවාදැයි තහවුරු කරගැනීමට ප්‍රජා පොලිස් රාජ්‍ය අමාත්‍යාංශයට අයත් වැය ලෙජර, ස්ථාවර වත්කම් ලේඛනය සහ පැවරීමට අදාළ ජ'නල් සටහන් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) මූලධන වැය විෂයයන් 8 ක් සහ පුනරාවර්ථන වැය විෂයයන් 7 ක් සඳහා ප්‍රතිපාදිත රු.43,965,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 18 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.584,890,000 ක් වූ ප්‍රතිපාදිතයෙන් රු.324,464,164 ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය සියයට 50 සිට සියයට 97 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඇ) 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 අංක දරන අයවැය චක්‍රලේඛයේ 3 (xvii) ඡේදය ප්‍රකාර වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම් ඒවා වර්ෂය අවසන්වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගතයුතු වුවත්, වැය විෂයයන් 25 සඳහා රු.91,000 සිට රු.92,600,000 දක්වා සියයට 22 සිට සියයට 3000 දක්වා පරාසයක ප්‍රතිපාදන මු.රෙ.66/69 මගින් මාරු කරගෙන තිබුණි.

(ඈ) 189-1-03-1701 පාඩු සහ කපාහැරීම් වැය විෂයය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් මුදල් වෙන් කරවාගෙන නොතිබුණ ද, මු.රෙ.66/69 යටතේ ලබාගත් රු.9,059,731 ක මුදලක් පාඩු සහ කපා හැරීම් වැය විෂයයට උපයෝගී කරගෙන තිබුණි.

(ඉ) වැය විෂයයන් 08 ක් සඳහා මු.රෙ.66/69 ප්‍රතිපාදන මාරු කිරීම් යටතේ වෙනත් වැය විෂයයන් ගෙන් රු.41,866,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණ ද, වර්ෂය අවසානයේ රු.61,909,457 ක්ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිවීම් සියයට 65 සිට සියයට 958 ක අතර ප්‍රමාණයකින් විහි දී තිබුණි.

2.2 බැරකම් හා බැඳීම් වලට එළඹීම

2022 මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (iii) බැඳීම් හා බැරකම් ප්‍රකාශයට අනුව බැරකම් රු.219,957,091 ක් වුව ද, බැරකම් ඉක්මවා රු.2,937,860 ක් ගෙවා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) විශේෂ කාර්ය බලකායේ " එක්සත් ජාතීන්ගේ සාම සාධක ව්‍යාපෘතිය"

i. අංක අමප / 16/0738/703/033 දරන 2016 මැයි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට අවශ්‍ය අවි ආයුධ,සන්නද්ධ රථ,ප්‍රවර්ථන වාහන, සන්නිවේදන උපකරණ ඇතුළු අනෙකුත් උපකරණ මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව නිලධාරීන් 160 දෙදෙනෙකු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් තෝරා ගැනීමෙන් පුහුණුවීම් ද ලබා දී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු.1,779,848,358 ක් වැය කර තිබුණ ද,

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සාමසාධක රාජකාරී සඳහා එක්වීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

ii. එක්සත් ජාතීන්ගේ සාමසාධක ව්‍යාපෘතියේ රාජකාරී සඳහා රැගෙන යාමට 2017 වර්ෂයේ සිට මේ දක්වා වාහන 42 ක් මිලදීගෙන කටුකුරුන්ද, හොරණ සහ ගෝනහේන යන විශේෂ කාර්ය බලකා කඳවුරු තුළ ස්ථානගත කර නඩත්තු කටයුතු සිදු කරමින් පවතින අතර, කටුකුරුන්ද පුහුණු පාසල තුළ මෙම රාජකාරී සඳහා රැගෙන යාමට මිලදීගෙන ඇති අනෙකුත් භාණ්ඩ හා උපකරණ ගබඩා කර නඩත්තු කර පවත්වාගෙන යනු ලබයි. මෙම මිලදී ගැනීම් සඳහා මේ වන විට රු. මිලියන 1780 ක් පමණ වැය කර තිබූ අතර මෙසේ මිලදී ගන්නා ලද වාහන ඇතුලු අනෙකුත් උපකරණ අවුරුදු 01 සිට 05 ත් අතර පමණ කාලයක සිට නඩත්තු කරමින් නිශ්කාර්යයව පැවතීම සහ එම භාණ්ඩවලට අදාළව ලබා දී ඇති වගකීම් කාලය උපයෝජනයකින් තොරව ඉකුත්වීම හා උපකරණ නිෂ්ක්‍රීයව පැවතීමෙන් සිදුවන හානි පිළිබඳ අවධානම විගණනයේ දී බැහැර කළ නොහැකි විය.

(ආ) විශේෂ කාර්ය බලකායේ "සන්නිවේදන උපකරණ මිලදී ගැනීම හා ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය"

i. විශේෂ කාර්ය බලකාය වෙත පැවරෙන රාජකාරී සාර්ථකව ඉටු කිරීමට ප්‍රමාණවත් හා ශක්තිමත් සන්නිවේදන ජාලයක් 2017- 2020 කාල පරිච්ඡේදය තුළ ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබුණි.මෙම ව්‍යාපෘතියේ මුළු වටිනාකම රු.195,582,818 ක් වූ අතර ව්‍යාපෘතිය සඳහා සැපයූ උපකරණ වෙනුවෙන් 2018 වර්ෂයේ රු.159,388,294 වැය කර තිබූ අතර ව්‍යාපෘතිය සඳහා උපදේශක සේවා සැපයීම වෙනුවෙන් ව්‍යාපෘතියේ මුළු වටිනාකමෙන් සියයට 1 ක ප්‍රතිශතයක් ගෙවිය යුතු වූ අතර, එම වටිනාකමෙන් සියයට 50 වටිනාකම වූ රු.977,914 ක් මේ වන විට ගෙවා තිබුණි.ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසුව තව දුරටත් ගෙවිය යුතු මුදල රුපියල් 149,812,020 ක් වේ.ව්‍යාපෘතිය 2017-2020 කාලපරිච්ඡේදය තුළ ස්ථාපිත කිරීමට සැලසුම් කළ ද, 2022 වර්ෂය අවසන් වන විටත් මෙම ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් වී නොතිබීම මත අපේක්ෂිත ශක්තිමත් සන්නිවේදන ජාලය බිහිකිරීමට විශේෂ කාර්ය බලකායට නොහැකි වී තිබුණි.

ii. මෙම ව්‍යාපෘතිය දැනට ස්ථාපිත කර ඇති පද්ධතියන් හි පහත සඳහන් දුර්වලතා හඳුනා ගෙන තිබූ අතර,අදාළ දෝෂයන් නැවත සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

- ප්‍රධාන පාලන මධ්‍යස්ථානය ඇතුළු ප්‍රතිග්‍රාහක ස්ථාන 16 න් 04 ක UPS පද්ධති හා ස්ථාන 03 ක බැටරි පද්ධති දුර්වල වී ඇති බවත්, ප්‍රධාන විදුලිය නොමැති අවස්ථාවන්හි දී එහි සන්නිවේදන යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය නතරවන බව.

- ස්ථාන 04 ක SERVER උපාංග 02 න් 01 බැගින් අක්‍රිය වී ඇති බවත්, එක් SERVER උපාංගයක් ආධාරයෙන් පමණක් යන්ත්‍ර පද්ධතිය ක්‍රියාකරන බව.
- කරගහතැන්න ප්‍රතිග්‍රාහකයේ බැටරි පද්ධතිය UPS උපාංගය හා SERVER උපාංග අක්‍රිය තත්ත්වයට පත්වීම හේතුවෙන් ප්‍රතිග්‍රාහකය සම්පූර්ණයෙන් අක්‍රියව ඇති බව.

3.2 වත්කම් කළමනාකරණය

i. විශේෂ කාර්ය බලකායෙහි පවතින ඉඩම් 19 ක් සමාලෝචිත වර්ෂය තුළ ද පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. වාකරේ,වාලවිවේන ඉඩම් සහ ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් තවදුරටත් ලබාගෙන නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

ආබාධිත නිලධාරීන් විශ්‍රාම යෑම, සේවයෙන් ඉවත් කිරීම සහ සේවය හැර යාම යනා දී හේතූන් මත දැනට සේවයේ නොමැති නිලධාරීන් හා සේවකයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂ 05 ට වඩා වැඩි ණයශේෂ එකතුව රු.389,850 ක් විය.

4. මානව සම්පත් කළමනාකරණය

(අ) 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	18	14	05	-
තෘතීක මට්ටම	05	01	04	-
ද්විතීක මට්ටම	70	67	18	15
ප්‍රාථමික මට්ටම	28	27	01	-
වෙනත්	05	04	01	
එකතුව	126	113	29	15

7

i. අනුමත කාර්යය මණ්ඩලයේ සියයට 23 ක් පුරප්පාඩු පැවතීම අමාත්‍යාංශ කටයුතු පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි.

ii. ද්විතීක මට්ටමේ අනුමත සංවර්ධන නිලධාරීන්ට වඩා අතිරික්ත නිලධාරීන් 15 දෙනෙකු සේවය කරන බව නිරීක්ෂණය විය.

iii. 2018 ජනවාරි 24 දින අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන්ව ඇති ඇමුණුම් 02 හි ආකෘතිය පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

iv. අමාත්‍යාංශය විසින් වැටුප් ගෙවන සංවර්ධන නිලධාරිනියක් 2022 දෙසැම්බර් 02 දින සිට වෙනත් පාර්ශවයක සේවය සඳහා නිදහස් කර තිබුණි.

v. වෙනත් පාර්ශවයන් විසින් වැටුප් ගෙවන බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සේවකයන් 07 දෙනෙකු අමාත්‍යාංශයේ රාජකාරී සඳහා යොදවාගෙන තිබුණි.

(ආ) විශේෂ කාර්ය බලකාය මානව සම්පත් කළමනාකරණය

i. නිල ඇදුම් කාර්ය මණ්ඩලය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	68	54	14	-
තෘතීක මට්ටම	346	404	21	79
ද්විතීක මට්ටම	10329	7250	3156	77
එකතුව	**10743**	**7708**	**3191**	**156**

- උප පොලිස් පරීක්ෂක තනතුරේ අනුමත සංඛ්‍යාව 812 ක් වුව ද, පුරප්පාඩු 313 ක් පැවතුන අතර, එය සියයට 38 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.
- ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ අනුමත සංඛ්‍යාව 67 ක් වුව ද, පුරප්පාඩු 14 ක් පැවතුන අතර එය සියයට 21 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

- මහ සැරයන් තනතුරේ අනුමත සංඛ්‍යාව 37 ක් වූ අතර, එම තනතුරේ කිසිවෙකු සේවයේ යෙදී නොතිබිණි.
- පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 6999 ක් වුව ද, පුරප්පාඩු 2503 ක් පැවතුන අතර එය සියයට 36 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.
- කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 163 ක් වුව ද, පුරප්පාඩු 84 ක් පැවතුන අතර එය සියයට 51 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.
- පොලිස් කොස්තාපල් රියදුරු තනතුරේ අනුමත සංඛ්‍යාව 577 ක් වුව ද, පුරප්පාඩු 209 ක් පැවතුන අතර එය සියයට 36 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.
- සමස්තයක් ලෙස ගත්විට විශේෂ කාර්ය බලකායේ නිල ඇදුම් කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 10743 ක් වුව ද, පුරප්පාඩු 3191 ක් පැවතුන අතර එය සියයට 30 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.
- කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධාරීන් 03 දෙනෙකු ද, පොලිස් පරීක්ෂක නිලධාරීන් 76 දෙනෙකු ද, පොලිස් සැරයන් තනතුරේ නිලධාරීන් 40 දෙනෙකු ද, කාන්තා පොලිස් සැරයන් එක් අයෙකු ද සහ පොලිස් සැරයන් රියදුරු 36 දෙනෙක් ද අතිරික්තව සේවයේ යෙදී තිබුණි.

ii. සිවිල් කාර්ය මණ්ඩලය

තනතුර	අනුමත සේවක සංඛයාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	5	5	-
තෘතීක මට්ටම	1	-	1
ද්විතීක මට්ටම	68,	41	27
ප්‍රාථමික මට්ටම	635	483	152
එකතුව	709	529	180

9

- සමස්තයක් ලෙස ගත්විට විශේෂ කාර්ය බලකායේ සිවිල් කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 709 ක් වුව ද, පුරප්පාඩු 180 ක් පැවතුන අතර එය සියයට 25 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

ආර්.එස්.කටුගම්පල

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

10

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මුල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිලිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරනය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම. මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ	ගර්හිත වාහන නොමැත	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය.**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය.**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්.**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම.**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම.**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාල නොවේ		
16.	**මානව සම්පත් කළමනාකරණය**			

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	2007.09.20 දිනැති MSD චක්‍රලේඛ 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17.	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධක ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිලියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		